# ලියාපදිංචිවීමට අයදුම් කිරීම සඳහාවූ සෝදිසි ලැයිස්තුව

ලියාපදිංචිවීම සඳහාවූ ආකෘතිය සම්පූර්ණ කිරීමට මෙම සෝදිසි ලැයිස්තුව උපකාර කර ගන්න. ඒ මගින් ඔබගේ අයදුම්පත්‍රය සම්බන්ධයෙන් කඩිනමින් කටයුතු කල හැකි අතර අප විසින් වැඩිදුර තොරතුරු ඉල්ලා සිටීම අවම කරගත හැකිය.

ලියාපදිංචිවීමට අයදුම් කිරීම සඳහාවූ සවිස්තරාත්මක මාර්ගෝපදේශය උපකාර කරගෙන ලියාපදිංචිවීම සඳහා ඇති ආකෘතියේ සෑම ප්‍රශ්නයකටම පිළිතුරු සපයන්න. www.acnc.gov.au/registrationguide වෙත යන්න. මෙම ලැයිස්තුවේ ඇති එක් එක් අයිතමය ඉදිරියෙන් සළකුණු කිරීමෙන් පසු www.acnc.gov.au/register හිදී ඔබට අයදුම්පත්‍රය සම්පූර්ණ කිරීම ආරම්භ කල හැකිය.

| ඔව්/නැත | පරීක්ෂාකර බැලිය යුතු කරුණු | සටහන් |
|---|---|---|
| ☐ | ඔබගේ සංවිධානය පුණ්‍යායතනයක්ද?<br>▪ ලියාපදිංචි පුණ්‍යායතනයක් වීමට එය ලාභ සඳහා නොවිය යුතු අතර මහජන සුබසිද්ධිය සඳහාවූ පුණ්‍ය අරමුණු පමණක් තිබිය යුතුය, නැතිනම<br>▪ පුණ්‍ය අරමුණු තිබිය යුතු අතර ඒ සමගින් එම පුණ්‍ය අරමුණුවලට ආනුෂංගික හෝ සමාන සහ එම අරමුණුවලට උපකාර කරන අරමුණු තිබිය යුතුය.<br>සටහන: ක්‍රීඩා, සමාජ හෝ විනෝදාත්මක අරමුණු සාමාන්‍ය වශයෙන් පුණ්‍ය කටයුතු වශයෙන් නොසැලකේ. | |
| ☐ | ඔබගේ සංවිධානය හට නුසුදුසුකම් ලබන අරමුණු නොමැති බවට සළකුණු කලේද?<br>පහත අරමුණු පුණ්‍ය අරමුණු නොවේ:<br>▪ නීතිවිරෝධී හෝ මහජන ප්‍රතිපත්තියට පටහැනි ක්‍රියාකාරකම්වල නිරතවීම හෝ එවා ප්‍රවර්ධනය කිරීම<br>▪ දේශපාලන පක්ෂයකට හෝ දේශපාලන තනතුරකට අපේක්ෂකයෙකු ප්‍රවර්ධනය කිරීම හෝ එයට විරුද්ධවීම | |
| ☐ | සංවිධානයේ නෛතික ව්‍යුහය ඔබ දන්නේද (සංස්ථාගත, සංස්ථාගත නොකල, මහජන සමාගම් ආදී)?<br>සටහන: කේවළ ව්‍යාපර, දේශපාලන පක්ෂ සහ රජයේ ආයතන ලියාපදිංචිය සඳහා අයදුම් කිරීමට සුදුසුකම් නොලබයි. | |

Australian Government

Australian Charities and Not-for-profits Commission

| | | |
|---|---|---|
| ☐ | ඔබගේ සංවිධානයට ඕස්ට්‍රේලියානු ව්‍යාපාර අංකයක් (Australian Business Number (ABN)) තිබේද? ABN සම්බන්ධයෙන් පහත දේ තිබෙන බවට සනාථ කර ගත්තාද?<br>▪ නියම නමින් ඇති බව, සහ<br>▪ නියම නෛතික ව්‍යුහය පෙන්වන බව?<br>අදාලනම්, ඔබට ASIC හෝ ORIC ලියාපදිංචි අංකද තිබේද? | |
| ☐ | ඔබගේ සංවිධානයේ පාලන ලියකියවිලි ඔබ සමග තිබේද? (උදාහරණ ලෙස එහි ව්‍යවස්ථාව, රීතීන්, භාර ඔප්පුව හෝ මෙමරන්ඩාව හෝ ආර්ටිකල් ඔෆ් ඇසෝසියේෂන්) | |
| ☐ | ඔබගේ පාලන ලියකියවිලිවල ඔබගේ පුණ්‍යායතන අයදුම්පතට සහාය ලබාදෙන වගන්තියක් ඇති බවට ඔබ පරීක්ෂාකර බැලුවාද?<br>උදාහරණ වශයෙන්:<br>▪ පුණ්‍ය අරමුණ හෝ අරමුණු වගන්තිය<br>▪ ලාභ සඳහා නොවන වගන්තිය<br>▪ ඈවර කිරීමේ වගන්තිය<br>▪ අවලංගු කිරීමේ වගන්තිය (ඕස්ට්‍රේලියානු බදු කාර්යාලයෙන් (ATO) ත්‍යාග සඳහා අඩුකිරීම් ලබාගත හැකි තහවුරුවක් ලබා ගැනීමට (DGR endorsement) මෙය අවශ්‍යවේ) | |
| ☐ | ඔබගේ සංවිධානයේ නෛතික නාමය ලියාපදිංචිය සඳහා සුදුසු බව පරීක්ෂාකර බැලුවාද? | |
| ☐ | ඔබගේ සංවිධානයේ:<br>▪ ලියවිලි ලබාදීම සඳහාවූ ලිපිනයක් තිබේද? (ඔබ සමග සන්නිවේදනයට සහ විධිමත් ලියකියවිලි එවීමට මෙම ලිපිනය භාවිත කෙරේ)<br>▪ ලියාපදිංචි ක්‍රියාවලියේදී විමසීම් සඳහා සම්බන්ධවීමේ විස්තර තිබේද? (මෙය ලියවිලි ලබාදීම සඳහාවූ ලිපිනයම විය හැකිය) | |
| ☐ | ඔබ කුමන උප ආකාරයේ පුණ්‍යායතනයක් ලෙස එය ලියාපදිංචි කරනවාද යන්න සලකා බැලුවාද? (මෙය එහි පුණ්‍ය අරමුණ(ණු) හා ගැලපිය යුතුය)<br>ඔබගේ සංවිධානයේ පාලන ලියකියවිලි, මෙම ක්‍රියාකාරකම් සහ අර්ථලාභීන් අනුව මෙම උප කාණ්ඩ යටතේ ලියාපදිංචියට ඉඩ ලබාදේද? | |
| ☐ | ඔබගේ සංවිධානය මහජන සුභසාධන ආයතනයක් (Public Benevolent Institution (PBI)) හෝ සෞඛ්‍යය ප්‍රවර්ධන පුණ්‍යායතනයක් (Health Promotion Charity (HPC)) ලෙස ලියාපදිංචි කිරීමට බලාපොරොත්තුවේද?<br>සටහන: එසේනම්, ඔබ විසින් අපට අමතර තොරතුරු ලබාදිය යුතුය. | |
| ☐ | ඔබගේ සංවිධානයේ සෑම වගකිවයුතු පුද්ගලයෙකුගේම උපන් දිනය, පදිංචි ලිපිනය, සම්බන්ධවීම සඳහා දුරකථන අංක සහ තනතුරු ඇතුළු සියළු විස්තර ඔබ සතුව තිබේද?<br>සටහන: වගකිවයුතු අයගේ ලිපිනයන්, උපන් දින සහ දුරකථන අංක අපි පළ නොකරමු. | |

| | | |
|---|---|---|
| ☐ | මෙම වගකිවයුතු පුද්ගලයන් සුදුසු අයද යන්න සහ ACNC පාලන සම්මතයන් යටතේ ඔවුනට ඇති කාර්යයන් අවබෝධ කරගෙන සිටීද යන්න ඔබ පරීක්ෂා කර බැලුවාද? | |
| ☐ | අදාල මූල්‍ය වාර්තා කිරීමේ කාලපරිච්ජේද, පෙර මුදල් වසර සඳහා ආදායම් සහ වියදම් (අදාල නම්) සහ මීලඟ මුදල් වසර සඳහා ඇස්තමේන්තු ඇතුළු මූල්‍ය තොරතුරු ඔබ සතුව තිබේද? | |
| ☐ | ඔබ සංවිධානය මගින් බදු සහන බලාපොරොත්තුවේද, එසේම ත්‍යාග සඳහා අඩුකිරීම් ලබාගත හැකි තඟවුරුවක් ලබා ගැනීමට බලාපොරොත්තුවේද? | |
| ☐ | ඔබගේ වගකිවයුතු පුද්ගලයන් හෝ සමහර තොරතුරු ACNC රෙජිස්ටරයේ පළ කිරීමෙන් වැළැක්වීමට ඉල්ලුම් කිරීමට ඔබ බලාපොරොත්තුවේද?<br>සටහන: වගකිවයුතු අයගේ උපන් දින සහ ලිපිනයන් අප විසින් පල නොකරනු ඇත. | |
| ☐ | ඔබගේ පුණ්‍යායතනය ලියාපදිංචිකලහොත්, ACNC පාලන සම්මතයන් සහ වාර්තා කිරීමේ අවශ්‍යතාවයන්ට අනුව කටයුතු කල යුතු බවට ඔබට අවබෝධයක් තිබේද? | |
| ☐ | ලියාපදිංචිය සඳහා ඇති අයදුම්පත්‍රයේ අත්සන් කිරීමට ඔබට බලය තිබේද? | |

## වැඩිදුර විස්තර

ලියාපදිංචිය සඳහා අයදුම් කිරීමේ මාර්ගෝපදේශ: www.acnc.gov.au/registrationguide

ලියාපදිංචිය සඳහා අයදුම්පත්‍රය: www.acnc.gov.au/register

බදු සහන: www.ato.gov.au/nonprofit

පුණ්‍යායතනවල වගකීම්: www.acnc.gov.au/ongoingobligations

පාලන සම්මතයන්: www.acnc.gov.au/governancestandards

## ACNC හා සම්බන්ධවන්න

දුරකථන: 13 ACNC (13 22 62)

ඊමේල්: advice@acnc.gov.au

තැපැල්: Advice Services, Australian Charities and Not-for-profits Commission, GPO Box 5108, Melbourne VIC 3001

ෆැක්ස්: 1300 232 569

ඉංග්‍රීසි හැර වෙනත් භාෂාවකින් අප හා කථා කිරීමට, නොමිළේ ලබාගත හැකි පරිවර්තන සහ තෝල්ක සේවාව (Translating and Interpreting Service (TIS)) උපයෝගී කරගත හැකිය. මෙම සේවාව භාවිතා කිරීමට, දුරකථන අංක 13 14 50 ඔස්සේ TIS අමතා දුරකථන අංක 13 22 61 ඔස්සේ අප අමතන ලෙස පරිවර්තකයෙකුගෙන් ඉල්ලා සිටින්න.

© කර්තෘ අයිතිය

ඔබට අවශ්‍ය ආකාරයට මෙහි ඇති කරුණු පිටපත් කිරීම, අනුවර්තනය කිරීම, යැවීම හෝ බෙදාහැරීම කල හැකිය (නමුත් ACNC හෝ කොමන්වෙල්ත් රජය මගින් ඔබගේ සේවා සහ නිෂ්පාදන අනුමත කරන ආකාරයට එය කල නොහැකිය).

මෙම ප්‍රකාශනය 2015 ජුලි මාසයට යාවත්කාලීනවේ